# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011**

**2013 මැයි - අගෝස්තු**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH E1025**

**චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය**

**පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### 1 කොටස

01. අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය දක්වන්න.

"දේවයන් වහන්ස, යම් යක්ෂ විකාරයක් ඇති වූ කල්හි සත්ත්ව තෙමේ වියරු හුණු බල්ලකු සේ හඬා ඇවිදී ද, එ සේ වූ, රජ ගෙටත් නොවැද්ද යුතු වූ නපුරු ස්වභාව ඇති නරදේව නම් යක්ෂයෙක් අවපසළොස්වක්හි මොහු ඇඟට නැඟෙයි. ඒ යක්ෂයා ඇඟට ආවිෂ්ට වූ කල්හි උන්මත්ත සුනඛයකු මෙන් සතර පය බිමැ ඔබා ගෙය මුළුල්ලෙහි හඬා ඇවිදී. ඒ යක්ෂ විකාරය තමාට ඇති නියාව තමාගේ පුතුට රහසැ කීයේ ය. ඔහු පුතුට ප්‍රකාශ කළ නියාව මා විසින් අසන ලද" යි වදාළ සේක. රජ්ජුරුවෝ, "සැබෑ ද කාවින්ද යැ" යි විචාරා, "සැබෑ යැ" යි කී කල්හි උනුත් දඟ ගෙයි ලැවූහ.

"දේවයන් වහන්ස, ප්‍රභාවතී බිසොවුන් නිසා ඒ සා යුද්ධයක් සජ්ජිත කොට ආ රජ්ජුරුවන් සත් දෙනෙකු, "මම සිංහස්වර කුස රජ යැ" යන වචන මාත්‍රයෙකින් පරාජය කොට ශත්‍රු සේනාවෙහි කිසි කෙනෙකුත්, ඇට මස්සකු බොන පමණත්, ලේ පොදක් නොසල්වා, චණ්ඩ පවනයෙකින් එක පැහැර වගුළ තල් වනයක් පරිද්දෙන් විසංඥ කොට හෙළා යුද්ධයේ ජය ලත් නුඹ වහන්සේගේ මීමුත්තණුවන් කුස රජ්ජුරුවන් වහන්සේට සන්තුෂ්ට වැ ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙන ලද්දා වූ මහත් වූ මංගල සම්මත අෂ්ටවංක මාණික්‍ය රත්නය නුඹ වහන්සේගේ භාණ්ඩාගාරයෙහි තුබුවා, දැන් දේවින්දයා අතට ගියේ ය. තමා මැණික සොරාගත් නියාව රහස් කොට මවට කීයේ ය. ඌ මවට කී රහසත් මා විසින් අසන ලද. දේවයන් වහන්ස, මම නුඹ වහන්සේට පසමිතුරු නොවෙමි. මෙකී පණ්ඩිතවරු සතර දෙන නුඹ වහන්සේට පසමිතුරෝ ය. පසමිතුරන්ගෙන් නුඹ වහන්සේට කාරියෙක් ඇත්නම්, මෙකී පණ්ඩිතවරුන් සතර දෙනා අල්ලා ගෙන කැමැත්තක් කළ මැනැවැ" යි වදාළ සේක. රජ්ජුරුවෝ, "සැබෑ ද, දේවින්ද යැ" යි අසා "සැබෑවැ" යි කී කල්හි උනුත් දඟ ගෙයි ලවා පීහ.

(ලකුණු 20)

ආ) පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

නොනැවත ගැඹුරු සයුරට ගොදුරට පිවි      ස
නු බ ප ත පැමිණ වැජඹෙන ගුරුළකු විල      ස
ම ද ම ත ගිජිඳු බඳවත් මඳ නොවී ල      ස
මො හු අත සිපත ගොස් නොරඳයි අහස මි      ස

ක ර වා පසඟතුරු ගොස රණබිමට බැ      ස
ත ර වා සීපත ගෙන සහ රුපු රදුන් ය      ස
ලෙ ළ වා ඔවුන් හදවත් සමඟින් පලි      ස
මො ළවා උනඹුවන් ළෙයි සෝක ගිනි රැ      ස

උඩු කර කඩුව පානා මෙන් සග ගි      ර ග
මුණ කර බිමට බිඳිනා තැන් පාන      ර ඟ
යට කර ම පද වැඳ වැටෙවයි කියන      ර ඟ
ඇම වර ලොවට පෙන්වයි අවිසරම      ර ඟ

රණවා පිය ලෙළෙහෙ වතුරෙන් ගත් තර ග
පුර වා පිය සොන් සිවලුන් සිත් සම ග
කර වා පිය අඟනන් සිත් විරහ ග ග
බ දවා පිය ජය දද අට දිගු යට ග

තැ වී යදල් බිඳ නැඟි ගිනි ක දේ යි දී
පෙවී පණසිපත මදතුන් බ දේ යි දී
ලැ වී ඔප කගින් කග වන් යු දේ යි දී
නි වී රුපුන් වියොගින් සුර මැ දේ යි දී

(ලකුණු 20)

## 11 කොටස

02. "උම්මග්ග ජාතකයෙන් වඩාත් ඉස්මතු වන්නේ මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥා මහිමයයි." විමසන්න.

03. හංස සන්දේශ කවියාගේ ප්‍රතිභා පූර්ණ කවිත්වය සනිදර්ශන ව පහදන්න.

04. "කුරුණෑගල සාහිත්‍ය යුගය පෝෂණය වූයේ පරිවර්තන ග්‍රන්ථවලිනි." මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

05. "ගම්පොළ සාහිත්‍ය යුගය ගද්‍ය-පද්‍ය දෙඅංශයෙන් ම කැපී පෙනෙන අවධියකි." සාකච්ඡා කරන්න.

06. කෝට්ටේ සාහිත්‍ය යුගය දීප්තිමත් කිරීමට තත්කාලීන කවීන්ගෙන් ලැබුණු දායකත්වය පහදන්න.

## 111 කොටස

07. ශබ්දෝච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය පිළිබඳ හැඳින්වීමක් කොට භාෂණ සිංහලයේ භාවිත ශබ්ද මාලාව (අක්ෂර) නම් කරන්න.

08. භාෂාව යනු කුමක්ද'යි හඳුන්වා මානව ශිෂ්ටාචාරයේ අභිවර්ධනය සඳහා භාෂාවේ කාර්‍ය භාරය පිළිබඳ විමසීමක් කරන්න.

09. ප්‍රාදේශීය උපභාෂා, සමාජීය උපභාෂා හා ප්‍රාස්තාවික භාෂා වෙන් වශයෙන් හඳුන්වා තමන් කැමති එක් ප්‍රාදේශීය උපභාෂාවක් පිළිබඳ විවරණයක් කරන්න.

10. "භාෂාව ජන්ම දායාදයක් නො ව සංස්කෘතික දායාදයකි." විමසන්න.

නැතහොත්

පහත සඳහන් මාතෘකාවලින් <u>හතරක් (04)</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. අනම්‍යාදේශය
ii. ස්වාභාවික සන්ධි හා කෘත්‍රිම සන්ධි
iii. පූර්ව නාසික්‍ය ව්‍යංජන
iv. සන්ධ්‍යක්ෂර
v. නෛපාතික ක්‍රියා
vi. ඝෝෂ මහාප්‍රාණ හා අඝෝෂ මහාප්‍රාණ
vii. ස්ථානය හා කරණය
viii. ඕෂ්ඨජ අක්ෂර (02 සිට 10 දක්වා පිළිතුරකට ලකුණු 15 බැගින්)

******************************